සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාරපරීක්ෂණය - 2018 11 ශ්‍රේණිය
Second Term Test - 2018 Grade 11

සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය I
Communication & Media Studies I

කාලය පැය 1
One hour

**සැලකිය යුතුය-**

1) සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
11) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වලදී (1) (2) (3) (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුරු තෝරා ගන්න.
111) ඔබට ගැලපෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01) දිගු කාලයක් එක් ජන කොට්ඨාශයක් විසින් පිළිගත් සන්නිවේදන ස්වරූප භාවිතය නිසා සන්නිවේදන සම්ප්‍රදායක් ඇති විය . ඒවා අද හඳුන්වනු ලබන්නේ
1) නූතන සන්නිවේදනය ලෙසය 2) සාම්ප්‍රදායික සන්නිවේදනය ලෙසය
3) වාචික සන්නිවේදනය ලෙසය 4) නිර්මාණාත්මක සන්නිවේදනය ලෙසය

02) ආදී කාලීන මානවයා පරිසරයේ විවිධ රූප නිර්මාණාත්මකව යොදා ගනිමින් අක්ෂර නිර්මාණ කරන ලදී. එම අක්ෂර හඳුන්වන නිවැරදි පිළිතුර අයත් වන්නේ
1) රූපාක්ෂර හා සංකේතාක්ෂර යනුවෙනි 2) චිත්‍රාක්ෂර හා සංකේතාක්ෂර යනුවෙනි
3) කීලාක්ෂර හා සංකේතාක්ෂර යනුවෙනි 4) රූපාක්ෂර හා චිත්‍රාක්ෂර යනුවෙනි.

03) මිනිසා හා තොරතුරු අතර පවත්නා සම්බන්ධතාවය වැදගත් වන ආකාර බොහොමයන් හඳුනාගත හැකි අතර ඊට අදාල නොවන සම්බන්ධතාවය වන්නේ
1) පුද්ගල අවශ්‍යතාව සපුරාලීම සඳහාය 2) තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහාය
3) ගැටලු නිරාකරණය නොකිරීම සඳහාය 4) පුද්ගල සබඳතා ගොඩනැගීම සඳහාය

04)" හැම උද්වේගකර ආරංචියක්ම ප්‍රවෘත්තියකි "යනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ
1 .පෝල් ඩී. මසෙනියර්ය 2) චාර්ල්ස් ඇන්ඩර්සන් ඩානාය
3) මිල්ටන් බ්‍රෂ්ය 4) හැරල්ඩ් ඩී. ලැස්වෙල්ය

05) තොරතුරු රැස්කරන්නෙකු සතුවිය යුතු මූලික ගුණාංග අතරට අයත් නොවන ගුණාංගය කුමක්ද ?
1) පක්ෂපාති බව 2) උපායශීලීබව 3) ආචාරශීලීබව 4) විචක්ෂණබව

06) ලේඛනයේ විකාශනය ගැන සලකා බැලීමේදී පුරාතන යුගයට අයත් නොවන අංගය කුමක්ද ?
1) ගල්ගුහා බිත්ති 2) ලෝහ අකුරු නිර්මාණ
3) මැටි පුවරු 4) කඩදාසි

07) ලොව ප්‍රථම ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ
1) කලම්බු ජර්නල්ය 2) වජ්‍ර සූත්‍රයයි
3) ලංකාලෝකයයි 4) උදායිතාරකායි

08) ලොව ප්‍රථම මුද්‍රණ යන්ත්‍ර මගින් පළමුවරට මුද්‍රණය කරන ලද්දේ ?
1) ලතින් ව්‍යාකරණයයි 2) බයිබලයේ ලතින් පිටපතයි
3) වජ්‍ර සූත්‍රයයි 4) කලම්බු ජර්නල්ය

09) මුද්‍රිත පුවත්පත් මුලින්ම පර්මනිය එංගලන්තය ප්‍රංශය හා ඇමරිකාව යන රටවල බිහිවුයේ
1) 15 වන ශත වර්ෂයේදීය 2) 16 වන ශතවර්ෂයේදීය
3) 17 වන ශත වර්ෂයේදීය 4) 18 වන ශත වර්ෂයේදීය

10) එංගලන්තයේ ආරම්භ කල ලන්ඩන් ගැසට් පුවත්පත එකල අවධානය යොමු කලේ
1) සමාජීය අවශ්‍යතා සපුරාලීම සඳහාව
2) දේශපාලනික අවශ්‍යතා සපුරාලිම සදහාය
3) ආගමික අවශ්‍යතා සපුරාලීම සදහාය
4) වෙළෙදුන්ගේ හා නාගරිකයන්ගේ අවශ්‍යතා සපුරාලිම සදහාය

11) ප්‍රංශයේ ලා ගැසතේ (LaGazette ) පුවත්පත මූලික වශයෙන් අවධානය යොමු කරන ලද්දේ
1) සමාජීය තොරුතුරුප්‍රකාශ කිරිම සදහාය
2) දේශපාලනික තොරතුරු ප්‍රකාශ කිරිම සදහාය
3) ආගමික තොරතුරු ප්‍රකාශ කීරිම සදහාය
4) ආර්ථික තොරතුරු ප්‍රකාශ කිරිම සදහාය

12) වර්ෂ 1793 දී සමතල මුද්‍රණ ශිල්පය බිහි කර ගැනිමට පුරෝගාමී වුයේ
1)අයිරා රබෙල්ය 2) ජෝහැන්ස් ගුටෙන්බර්ග්ය
3) ගුග්ලි එල්මෝ මාර්කෝනිය 4) ඇලොයිස් සෙනෙෆෙන්ඩර්ය

13) මුද්‍රණ සිලින්ඩර තුනක් දක්වා වැඩි කර ඔප්සෙට් ලිතෝග්‍රැෆි ක්‍රමය හදුන්වා දුන්නේ
1) අයිරා රබෙල්ය 2) හැරල්ඩ් ඩී. ලැස්වෙල්ය
3) ඇලොයිස් සෙනෙෆෙන්ඩර්ය 4) ජොහැන්ස් ගුටෙන්බර්ග්ය

14) ඔප්සෙට් ලිතෝග්‍රැෆි ක්‍රමයේදී වර්ණ හතරක මූලධර්මය භාවිත කිරිම එහි විශේෂත්වයට හේතුවිය. එම වර්ග හතර ලෙස හදුනාගත හැක්කේ
1) නිල් (සායන්) රත (මැජෙන්ටා ) කහ සහ කළු වර්ණය
2) දම් /රෝස/කහ සහ සුදු වර්ණය
3) නිල් (මසායන් )රතු (මැජෙන්ටා) කොළ සහ සුදු වර්ණය
4) දම්/රෝස/ කොල සහ කළු වර්ණය

15) ශ්‍රී ලංකාවට මුද්‍රණ ශිල්පය මුලින්ම හදුන්වා දුන්නේ
1) පෘතුගීසීන්ය 2) ලන්දේසීන්ය 3) ඉංග්‍රිසින්ය 4) ඉන්දියානුවන්ය

16) පොත්පත් පරිශිලනයෙන් මනාවයාට ලැබෙන ප්‍රමුඛ වාසි අතරට අදාල නොවන්නේ
1) භාෂා ඥානයයි 2) පරිකල්පන හැකියාවයි
3) දැනුම හා අනවබෝධයයි 4) විචාරාත්මක චින්තනයයි

17) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පළමු සිංහල පුවත්පත නම් කරන්න
1) ලංකාලෝකය 2) ලක්මිණි පහන 3) කවට කතිකයා 4) සිංහල බෞද්ධයා

18) රැහැන් ඔස්සේ විදුලි සංඥා යැවීම හෙවත් විද්‍යුත් සංඥා සම්ප්‍රේෂණය කිරිම පළමුවරට සොයා ගන්නා ලද්දේ
1) මිල්ටන් බ්‍රෂ් විසිනි 2) අයිරා රබෙල්ය
3) ගුග්ලි එල්මෝ මාර්කෝනි විසිනි 4) සැමුවෙල් එෆ් බී. මෝරස් විසිනි

19) එක් ස්ථානයකින් තවත් ස්ථානයකට රැහැනකින් තොරව විදුලි සංඥා මගින් පණිවිඩයක් යැවු ප්‍රථම පුද්ගලයා නම් කරන්න.
1) ගුග්ලි එල්මෝ මාර්කෝනි විසිනි 2) සැමුවෙල් එෆ් බී. මෝරස් විසිනි
3) අයිරා රබෙල්ය 4) ෂැනොන් හා වීවර්ය

20) ශ්‍රී ලංකාවේ ගුවන් විදුලිය විකාශනයේ නිර්මාතෘවරයා නම් කරන්න
1)සැමුවෙල් එෆ් බී. මෝරස් මහතාය	2) එඩ්වඩ් හාපර් මහතාය
3) ඩී . ඇම්. කොළඹගේ මහතාය	4)ජෝන් එන්.ලැම්සජන් මහතාය

21) ශ්‍රී ලංකාවේ ප්‍රධාන නාලිකාවට අමතරව ප්‍රාදේශිය හා ප්‍රජා ගුවන්විදුලි සේවා ආරම්භයද සිදුවිය. ශ්‍රී ලංකාවේ ආරම්භ කල ප්‍රථම ප්‍රාදේශිය ගුවන්විදුලි සේවය නම් කරන්න
1) රුහුණු සේවය	2) දඹාන රේඩියෝව
3) මහවැලි ප්‍රජා ගුවන්විදුලිය	4) රජරට සේවය

22) යම්කිසි සංදේශයක් ග්‍රහණය කර ගැනිම සදහා ශ්‍රවණය කිරිම අත්‍යවශ්‍ය වන ජන මාධ්‍ය කුමක්දැයි සදහන් කරන්න
1) පුවත්පත	2) ගුවන්විදුලිය	3) රූපවාහිනිය	4) පරිගණකය

23) නූතන ලෝකය පුරා පැතිර ඇති ගුවන්විදුලි මධ්‍යස්ථාන සිය සම්ප්‍රේෂණය සදහා ගුවන්විදුලි තරංග කිහිපයක් භාවිත කරයි. එසේ නූතනයේ බහුලව භාවිත නොකරන මාධ්‍යයක් වන්නේ
1) මධ්‍යම තරංගය	2) කෙටි තරංගය
3) මෝර්ස් සංඥාය	4) සංඛ්‍යාත මූර්ජන තරංගය

24) ජර්මන් ජාතික පූජකවරයෙකු වු ඇතනේසියර් ක්රේචර් විසින්
1) මැජික් ලන්තැරුම නිර්මාණය කරනු ලැබීය.
2) නිශ්චල ඡායාරූපය ලොවට හදුන්වා දෙනු ලැබීය
3) දෘෂ්ටියේ අඛණ්ඩතාවය පිළිබඳ සිද්ධාන්තය සොයා ගැනිම
4) 'සෙලියුලොයිඩ් ' සේයා පටලය සොයා ගනු ලැබීය

25) ශ්‍රී ලංකාවේ රූපවාහිනි ඉතිහාසයේ පුරෝගාමී භූමිකාවක් ඉටු කරන ලද්දේ කවුරුන්ද ?
1) ජෝන් ලොගී බෙයාඩ් ය	2) ශාන් වික්‍රමසිංහය
3) අනිල් විජේවර්ධනය	4) බොබ් ක්‍රිස්ටීය

26) ජන මාධ්‍යයන් අතරින් ගුවන්විදුලියේ භාෂා භාවිතය ඉතා වැදගත්වේ. එහිදි ගුවන්විදුලිය නිවේදකයෙක් සිය ග්‍රාහකයන් ඇමතිය යුත්තේ
1)එම සමාජයේ සියලු ග්‍රාහකයන්ට පොදුවේ අමතන ආකාරයෙනි
2) සමාජ විවිධතාවන්ට උචිතවන ලෙසිනි
3) ඉලක්ක ග්‍රාහකයා සිතින් මවා ගනිමිනි
4) තනි තනි පුදග්ලයාට අමතන අයුරිනි

27) මාධ්‍ය පරිහරණය කිරිම ග්‍රාහකයෝ විවිධාකාරයෙන් සිදු කරති. එයින් සිනමා මාධ්‍යයේ නිර්මාණාත්මක ලක්ෂණ වටහා ගත හැකිවන්නේ
1) අන්තර්ජාලය මගින් චිත්‍රපට නැරඹීමෙනි
2) සංගත තැටි මගින් චිත්‍රපට නැරඹීමෙනි
3) සිනමා ශාලාවක් තුළ චිත්‍රපට නැරඹීමෙනි
4) රූපවාහිනය මගින් චිත්‍රපට නැරඹීමෙනි

28) රූපවාහිනි ටෙලි නාට්‍යයක මෙන් නොව ගුවන් විදුලි නාට්‍යයකට සවන් දීමේදි එකි සිදුවීම් පිළිබද රූප අප සිත්හි මැවේ. මෙය
1) ද්වීරූපිතාවයයි	2) රූපක භාවිතයයි	3) පරිකල්පනයයි	4) ක්ෂේත්‍ර ගැඹුරයි

29) රූපවාහිනි මාධ්‍යයේ මෙන් නොව සිනමා මාධ්‍ය භාවිතා කරන්නෙකුට වඩාත් වැදගත් සිද්ධාන්තය වන්නේ
1) දෘෂ්ටියේ අඛණ්ඩතාවයි	2) දුර දෘෂ්ටිකත්වයයි	3) දෘෂ්ටි ගෝචරභාවයයි	4) ක්ෂේත්‍ර ගැඹුරයි

30) සමාජය තුළ සිදුවන විවිධ සිදුවීම් වඩාත් යථාර්ථයක් ලෙස නිරූපණය කරන්නේ
1) කෙටි චිත්‍රපටිවලදීය	2) වාර්තා චිත්‍රපටිවලදීය
3) වෘත්තාන්තමය චිත්‍රපටවලදීය	4) නිහඬ සිනමාවේදීය

31) රූපවාහිනි සිනමාව වැනි මාධ්‍යවල සිදු කරන සංස්කරණ කාර්යයෙන් ලැබිය හැකි වැදගත්ම ප්‍රයෝජනය වන්නේ නිර්මාණයේ

1)අත්‍යවශ්‍ය වියදම් අඩු කරගත හැකිවීමයි 2) සංක්ෂිප්ත බව ආරක්ෂා කර ගැනිමය
3) අවස්ථා සම්බන්ධ පවත්වා ගත හැකි විමයි 4) අර්ථ මතු කරගත හැකි විමයි

32) රූපවාහිනය හෝ ගුවන්විදුලිය මගින් ප්‍රචාරය කෙරෙන දැන්වීමක ගාස්තුව තීරණය කිරිමට බලනොපාන්නේ

1) එකී දැන්වීමේ අන්තරගතයයි 2) එය ඉදිරිපත් කරන අවස්ථාව හා වේලාවයි.
3) ඒ සඳහා යොදා ගනු ලබන කාලයයි 4) එම නාලිකාවේ ව්‍යාප්තියයි

33) ගුවන්විදුලි වැඩසටහන් නිෂ්පාදකයෙකුගේ ප්‍රධාන භූමිකාව වන්නේ

1) වැඩසටහනට ඉදිරිපත් කිරිමයි 2) වැඩසටහන් සෑදිමට අරමුදල් යෙදවීමයි
3) වැඩසටහන පිළිබඳ සමස්ත වගකීම දැරීමයි 4) වැඩසටහනේ තාක්ෂණික කටයුතු මෙහෙයවීමයි

34) රූපවාහිනියේ විකාශ වු අධ්‍යාපනික වැඩසටහනක් නැරඹූ අමල් එහි සඳහන් විෂය කරුණක් පිළිබද නාමල්ගෙන් ඇසිය යුතු බව කල්පනා කළේය. මෙහි සඳහන් වන සන්නිවේදන වර්ග දෙක වනුයේ

1)දෘශ්‍ය සන්නිවේදනය හා අන්තර්පුද්ගල සන්නිවේදනයයි
2) ජන සන්නිවේදනය හා අවාචික සන්නිවේදනයයි
3)දෘශ්‍ය සන්නිවේදනය හා අවාචික සන්නිවේදනයයි
4) ජන සන්නිවේදනය හා අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි

35) සමහර අවස්ථාවලදී එකම රූපවාහිනි වැඩසටහනක් තුළ ප්‍රවෘත්ති ,කාලීන, භාව සංවේදී, විචිත්‍ර ආදී ගුණාංග රැසකින් යුත් කොටස් ගණනාවක් අන්තරගත කර ඇති විට එවැන්නක්

1) වාර්තා වැඩසටහනකි 2) සඟරාමය වැඩසටහනකි
3) යථාකාරි වැඩසටහනකි 4) සෝප් ඔපෙරාවකි

36) නව සහ නූතන මාධ්‍ය යනුවෙන් මාධ්‍ය ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් යටතේ බෙදා දැක්විය හැකිය. එයින් නව මාධ්‍ය කාණ්ඩය කුමක්දැයි පහත සඳහන් වරණ වලින් තෝරා ලියන්න

1) අන්තර්ජාල, පුවත්පත්, රූපවාහිනිය ,ගුවන්විදුලිය 2) රූපවාහිනිය ,කෙටි පණිවිඩ, සමාජජාල
3) විද්‍යුත් තැපැල, සමාජ ජාල, කෙටි පණිවිඩ 4) පුවත්පත, ගුවන්විදුලිය, රූපවාහිනිය

37) විද්‍යුත් තැපැල විධික්‍රම අතරින් අන්තර් පුද්ගල සන්නිවේදනයට අයත් නොවන්නේ

1) විද්‍යුත් තැපැල් ගිණුමක් ඇරඹීම 2) ලිපියක් යැවිම
3) කෙටි පණිවිඩයක් යැවිම 4) අතට අත දීම

38) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අත්පත්‍රිකා සම්බන්ධයෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න

1) නොමිලේ බෙදා හැරිමක් සිදුකරයි
2) ප්‍රමාණයෙන් පෝස්ටරය හා සමාන වේ
3) කියවීමෙන් පසු එකතු කර තබා ගන්නා මුද්‍රිත මාධ්‍යයකි
4) දිනයක් ,වේලාවක් , ස්ථානයක් සඳහන් නොකරයි

39) වෙබ් රෝඩියෝවක් සම්බන්ධයෙන් ගැළපෙන ප්‍රකාශය තෝරන්න

1) මුදල් ගෙවා බලපත්‍රයක් ලබා ගැනිම අත්‍යවශ්‍ය වේ.
2) සරල උපකරණ කිහිපයකින් පවතත්වා ගෙන යා නොහැකිය
3)FM රේඩියෝ නාලිකාවට සාපේක්ෂව වියදම් වැඩිය
4) ලොව පුරා ඕනෑම තැනක සිට ශ්‍රවණය කළ හැකිය.

40) ඡායාරූපයක වස්තුව පැහැදිලිව තිබියදී පසුබිම අපහැදිලි කිරිමට අවශ්‍ය වී තිබේ. එස් කිරිමට නම්

1) නාභිදුර වැඩි කළ යුතුය 2) ද්වාර වේගය අඩු කල යුතුය
3) කාච වච්වරය වැඩි කළ යුතුය 4) වස්තු දුර අඩු කළ යුතුය